# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2378/13 – 2024 අප්‍රේල් මස 02 වැනි අඟහරුවාදා – 2024.04.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/165.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.10.30 දිනැති හා අංක 2356/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙවලපොල, වල්පිටමුල්ල, අංක 20 හි පදිංචි මල්ලිකා පී. උක්වත්තගේ මිය සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, ''මගනැගුම මහමැදුර'' හි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 63/2023 හා 2024.02.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැ.බ).

2024 මාර්තු මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී

මල්ලිකා පී. උක්වත්තගේ මිය,
අංක 20, වල්පිටමුල්ල,
දෙවලපොල.

*පළමුවැනි පාර්ශ්වය*

*එදිරිව*

යොමු අංකය: A/63/2023
IR/COM/01/2021/165

මාර්ග සංවර්ධන අධිකාරිය,
''මගනැගුම මහමැදුර'',
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටිම.

නීතිඥ කමල් අමරසිංහ මහතා
නීතිඥ කේ. ජී. කුමාරසිංහ මහතා
මල්ලිකා පී. උක්වත්තගේ මිය

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටිම.

නීති නිලධාරි වසන්තා අම්බුලුගල මිය
අතිරේක අධ්‍යක්ෂ පාලන එස්. සී. පී. සූරියප්පෙරුම මිය
මානව සම්පත් පරිපාලන ඩබ්ලිව්. එච්. කාන්ති මිය
නීතිඥ ඔෂිණි සේනාධිපති මිය
අතිරේක අධ්‍යක්ෂ එම්. එන්. සූරියකුමාරන් මයා
නීතිඥ එස්. ඒ. ඩී. නිශාන්ත මහතා
නීතිඥ උෂිර ධර්මරත්න මහතා

## ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2023.10.18 හා අංක IR/COM/01/2021/165 ලිපියෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුලට තුඩුදුන් කාරණය.

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/01/2021/165 හා 2023.10.10 දින ලිපිය අනුව ''මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ මල්ලිකා පී. උක්වත්තගේ මහත්මිය හට පහත කරුණු මගින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද කවරදා සිටද යන්නත් පිළිබඳව වේ''

01. අතිරේක අධ්‍යක්ෂක (පාරිපාලන) තනතුර හිමිද? හිමි නම් එය ලබා නොදීම.

02. 2019.08.31 දිනට 01 ශ්‍රේණිය හිමිද? හිමි නම් එය ලබා නොදීම.

03. 2009.08.19 සිට ආයතනයේ ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව වැටුප් විෂමතාවය ඉවත් කිරීමට අනෙකුත් සේවකයන්ට ලබාදුන් වැටුප් වර්ධක 04 ක් හිමිද? හිමිනම් එය ලබානොදීම.

<u>බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය</u>

මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් සියුම් නීති තර්ක හා ඇතැම් ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත් කිරීමේ අවස්ථා මෙන්ම මෙම පැමිණිල්ල ප්‍රතික්ෂේප කරන ලෙසටත්, මෙය ඇසීමේ බලයක් නොමැති බවත් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද නීති තර්ක හා ලිඛිත ඉල්ලීම් හා උත්සාහයන් ද අවසාන ලිඛිත දේශනවලදී ඇතැම් ලේඛන හා නඩු තීන්දු පිළිගන්නා ලෙසද කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් ද පවත්වාගෙන ගිය බේරුම්කරණයක් බව සඳහන් කරමි. මෙම බේරුම්කරණය කළට වේලාවට අවසන් කිරීමේ අවශ්‍යතාවයත් රටේ වත්මන් ආර්ථික අර්බුදයත් සැලකිල්ලට ගනිමින් මා හට ලබාදෙන ලද ලිඛිත උපදෙස් පරිදි ඒ පිළිබඳව දෙපාර්ශ්වය දැනුවත් කර ඊට අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

පහත සඳහන් දිනයන් යටතේ බේරුම්කරණයට දෙපාර්ශ්වයම කැඳවා විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2023.11.09 | 2024.01.04 |
| 2023.11.16 | 2024.01.11 |
| 2023.11.30 | 2024.01.17 |
| 2023.12.19 | 2024.01.30 |

මෙම නඩුවේ ඉල්ලුම්කාරිය වන මල්ලිකා පී. උක්වත්තගේ මිය 1987.11.23 වන දින මාර්ග සංවර්ධන අධිකාරියේ ලිපිකාරිණියක් වශයෙන් සේවයට බැඳී ඇත. 2006.04.20 වන දින සිට ඇය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද තරග විභාගය සමත් වීමෙන් පසු පරිපාලන නිලධාරි වශයෙන් පත්වීම් ලබා ඇත. ඉන්පසු එම තනතුරේ 03 ශ්‍රේණියටත් අනතුරුව 1-1 ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත. 2017.08.31 වන දින සිට ජ්‍යෙෂ්ඨ පාලන නිලධාරි 2.1 ශ්‍රේණියට පත්කර ඇත. මෙම තනතුර පසුව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛය අනුව ජ්‍යෙෂ්ඨ මානව සම්පත් පරිපාලක (MM 1-3 ශ්‍රේණිය) වශයෙන් තනතුරු නාමය වෙනස් කර ඇත. ඉල්ලුම්කාරිය 2021.10.21 වන දින සේවය විශ්‍රාම ගොස් ඇත.

ඇය කියා සිටින්නේ ඇයට අතිරේක අධ්‍යක්ෂක (පාලන) තනතුර 2019.08.31 හිමි වුවත් මාර්ග සංවර්ධන අධිකාරිය එම තනතුර ඇයට ලබා නොදුන් බවත්, එමෙන්ම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ වැටුප් විෂමතාවය ඉවත් කිරීමට අනෙකුත් සේවකයන්ට ලබාදුන් වැටුප් වර්ධක 04 ඇයට ලබා නොදුන් බවයි. එමෙන්ම 2019.08.31 වන දින සිට ඇයට හිමි 01 ශ්‍රේණිය ලබා නොදුන් බවත්ය.

2023.11.16 වන දින බේරුම්කරණය හමුවේ අතිරේක අධ්‍යක්ෂ (පාලන රාජකාරි ආවරණ) එස්. සී. පී. සූරියප්පෙරුම මහත්මිය සාක්ෂි දෙමින්

ප්‍ර අතිරේක අධ්‍යක්ෂක (පාලන) තනතුරට කෙහොමද බඳවා ගන්නේ ?

පි මේ කාලයේ අර්බුදයක් තිබුනා. 2016 සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කියලා තිබුනා බඳවා ගැනීමේ පරිපාටියක් ඉදිරිපත් කරන්න කියලා.මම දැනගත් විදිහට 2005 විදිහට ආර්. ඩී. ඒ. එකේ සිදු වී තිබෙනවා කළමනාකරණ දෙපාර්තමේන්තුවට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තනතුර අනුමත වීමක් ලැබෙනකල් අයදුම්පත් කැඳවීමක් කළේ නෑ. අධ්‍යක්ෂක ජනරාල් තීරණයක් ගත්තෙත් නැහැ. සුදුසුකම් රහිත අය එනවා කියලා 2.1 ශ්‍රේණියේ පමණක් ඉඳලා යන්න අවස්ථාව දීලා තියෙනවා.

ප්‍ර කොපමණ කාලයක්ද ?

පි 2.1 ශ්‍රේණියේ අවුරුදු 2 ක් ඉඳලා මේ ශ්‍රේණියට යන්න පුළුවන්.

ප්‍ර 2.1 ශ්‍රේණියේ වසර 2 ක් හිටියාම යන්න පුළුවන්.

ප්‍ර ඉල්ලුම්කාරියට අවුරුදු 02 සම්පූර්ණ වෙන්නේ කවදද?

පි 2.1 ශ්‍රේණියට පත්වෙලා තියෙන්නේ 2017.08.31 ඒ අනුව අවුරුදු 02 සම්පූර්ණ වන්නේ 2019.08.31

ප්‍ර සුදුසුකම් ලැබුවාට පසුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වූවාද ?

පි ඔව්

ප්‍ර ඇයි ඉදිරියට ගියේ නැත්තේ ?

පි නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තනතුරට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අදටත් අනුමත වෙලා ඇවිත් නැ. මේ ශ්‍රේණියේ ගොඩාක් අය ඉන්නවා යන්න. 2005 එකෙන් ගන්න බැහැ කියලා කළමනාකාරිත්වය තීරණය කළා.

ප්‍ර මේ වන විට පිළිතුරු ලැබිලා තියෙනවාද ?

පි නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තනතුර හැරෙන්න ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂක ජනරාල් මැතක දී MM කේතයට ඇවිත් තියෙන්නේ මැදපෙළ 1 ශ්‍රේණියේ තනතුර ලෙසටයි.

ප්‍ර මැතකදී කවද්ද ?

පි 2023.10.25

ප්‍ර මේ ලිපියෙන් ද අනුමත වුනේ ?

පි ඔව්

ප්‍ර මොකක්ද අනුමත වුනේ ?

පි මානව සම්පත් සීනියර් අය M.M.01-03 යටතේ 01 ශ්‍රේණියට තමයි අනුමත වෙලා තියෙන්නේ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර තාම අනුමැතියක් ආවේ නැහැ.
(පිටු අංක 073-074-075)

නිරීක්ෂණ හා නිගමනයන්

මේ අනුව නිරීක්ෂණය වන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂක පාලන තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මේ දක්වා අනුමත වී නොමැති බවයි.

පිටු අංක 048 සඳහන් පරිදි විගණන විමසුවෙන් පසුව නව බඳවා ගැනීම් පරිපාටියක් සකස් කරන තුරු අතිරේක අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම අත්හිටුවා ඇති බවයි.

එහෙත් ඉල්ලුම්කාරියට අභ්‍යන්තර අයදුම්කරුවකු ලෙස ඉදිරිපත්වීමට අවස්ථාව ලබාදී ඇත.

ඒ අනුව 2005 බඳවා ගැනීමේ පරිපාටියට අනුව අයදුම්පත් කැඳවා ඒ අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ දී ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කරන ලද සහතික වල අව්‍යාජ භාවය පිළිබඳව ගැටලු සහගත තත්වයක් පැන නගින නිසා නිර්දේශ වී නොමැති බව සඳහන් කර ඇත.

ඉහත කරුණු දෙවන පාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශයෙන් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ඇය 2019.08.31 වන දිනට වර්ෂ 02 සම්පූර්ණ කර ඇත. ඇය මේ වන විට ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි වශයෙන් M.M.01-03(01) ශ්‍රේණිය කටයුතු කර ඇත. අතිරේක අධ්‍යක්ෂක (පාලන) එස්. සී. පී. සූරියප්පෙරුම මහත්මිය සාක්ෂි දෙමින් අතිරේක අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොහැති බව සඳහන් කර ඇත.

අංක 856/2015 දරන මණ්ඩල පත්‍රිකාව මගින් 2005.01.01 සිට අනුමැතිය ලබාදී ඇති බඳවා ගැනීමේ පටිපාටියේ (3) (iv) පරිදි 2021.10.04 වන දින ඉල්ලුම්කාරිය අතිරේක අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු ඇයට පත්වීම් ලබාදීමට 2018.08.24 චක්‍රලේඛ යටතේ අධ්‍යක්ෂක ජනරාල් විසින් අභ්‍යන්තරයෙන් අයදුම්පත් කැඳවා ඇත. එය සාක්ෂිකාරිය අධිකරණයේ පිළිගෙන ඇත. (පිටු අංක 079)

මෙම තනතුරට අදාලව වසර දෙකක සේවය පදනම් කරගෙන සුමිත්‍රා ප්‍රනාන්දු මහත්මියට 2018.04.24 වන දින අයදුම්පත් කැඳවා 2018.04.20 සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) වශයෙන් මෙම තනතුර ලබා දී ඇති බව (පිටු අංක 89) සාක්ෂිකාරිය පිළිගෙන ඇත.

සුමිත්‍රා ප්‍රනාන්දු මහත්මිය විශ්‍රාම යාමෙන් පසු මේ ආකාරයටම එම්. එන්. සූරියකුමාරන් මහතාද 2018.12.24 වන දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තනතුරට පත්කර ඇති බව පෙනී යයි.

මේ අනුව පෙනී යන්නේ මෙම තනතුර ලබාදීමට කළමනාකාරසේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තුරු නොසිටි අතර එය බාධාවක් කර නොගත් බවයි.

දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ පළමු විස්තර ප්‍රකාශයට අදාළව පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කරමින් එහි 5 යටතේ (පිටු අංක 083 ) ඇයගේ 2006/2008 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ශාස්ත්‍රපති උපාධියට අදාලව ඉල්ලුම්කාරිය ව්‍යාජ සහතිකයක් ඉදිරිපත් කර ඇති බවයි. එහෙත් දෙවන පාර්ශ්වය විසින් මෙම අධිකරණයට SLIDA ආයතනය මගින් ලබාදුන් එම ප්‍රකාශය තහවුරු කිරීමට අදල ලිපි ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මත මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අදාළ උපාධි සහතිකය ව්‍යාජ එකක් බවට ඉදිරිපත් කරන ලද මතය ප්‍රතික්ෂේප කරන ලද බව සඳහන් කරමි. (පිටු අංක 135) තවද පිටු අංක 156 අධිකරණ සටහන් අනුව අදළ මාස්ටර් ඔෆ් ඇඩ්මිනිස්ට්‍රේෂන් පාඨමාලාව හැදෑරූ බව සහතික වන බව සඳහන් කර ඇත. (R17) ලිපියෙන් එය තහවුරු වේ. එහෙත් දෙවන පාර්ශ්වය විසින් 2023.11.29 දින වන විටත් කරුණු රැස් කරමින් සිටින බවයි. මේ අනුව ඉල්ලුම්කාරියගේ ශාස්ත්‍රපති උපාධිය ව්‍යාජ එකක් බවට දෙවන පාර්ශ්වය කරන ප්‍රකාශය පිළිගැනීමට නොහැකි බවට තීරණය කරමි.

මෙම 2005 බඳවා ගැනීමේ පටිපාටියට අදාලව උක්ත තනතුර සඳහා

(1) ජ්‍යෙෂ්ඨ මානව සම්පත් පරිපාලක එම්. එන්. සූර්යකුමාරන් මහතා 2-1 ශ්‍රේණියට 2016.12.01 වන දින පත්වීම් ලබා ඇති අතර ඔහු විසින් ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා 2005 බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම්වලට අනුකූලව 2-1 ශ්‍රේණියේ වසර 02 සේවා කාලයක් සම්පූර්ණ කොට අභ්‍යාන්තර බඳවා ගැනීමේ පටිපාටින්ට අනුකූලව නීති හා රෙගුලාසින්ට අනුව 2018.12.24 වන දින අතිරේක අධ්‍යක්ෂක (පාලන) තනතුර සඳහා පත්වීම් ලබා ඇති බවයි. (පිටු අංක 079) මේ බව දෙවන පාර්ශ්වය විසින් පිළිගෙන ඇත.

(2) ජ්‍යෙෂ්ඨ මානව සම්පත් පරිපාලක සුමිත්‍ර ප්‍රනාන්දු මිය 2018.08.24 චක්‍රලේඛ 2018/CL/15 අනුව අධ්‍යක්ෂක ජනරාල්ගේ නියමය පරිදි අභ්‍යාන්තරයෙන් අයදුම්පත් කැඳවීම අනුව වසර 02 පළපුරුද්ද පදනම් කරගෙන 2005 බඳවා ගැනීමේ පටිපාටියට අනුව 2018.04.20 වන දින සිටි අතිරේක අධ්‍යක්ෂ පාලන තනතුර ලබාදී ඇති බව දෙවන පාර්ශ්වය පිළිගෙන ඇත (පිටු අංක 082).

ඉල්ලුම්කාරිය වන මල්ලිකා පී. උක්වත්තගේ මිය 2019.08.31 වන දිනට අතිරේක අධ්‍යක්ෂ පරිපාලන තනතුර සඳහා අභ්‍යාන්තර නිලධාරියෙකු වශයෙන් 2005 බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව 2-1 ශ්‍රේණියේ වසර 02ක සේවයක් සම්පූර්ණ කොට අභ්‍යාන්තර බඳවා ගැනීමේ පටිපාටින්ට හා නීතිමය රෙගුලාසින්ට අනුකූලව අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ බව නිරීක්ෂණ වූ අතර එය දෙවන පාර්ශ්වය විසින් ද පිළිගෙන ඇත.

මේ අනුව ඇය 2021.10.04 වන දින අධ්‍යක්ෂක ජනරාල් විසින් පත්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පෙනි සිට ඇති අතර ඇගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඇය එම තනතුරට වහාම පත්කළ යුතු බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සටහනක් මගින් පෙන්වා දී ඇත. (ඇමුණුම 10) එහෙත් මෙම පත්වීම කිරීම සඳහා ගොනුව අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කල විට අදාල ගොනුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් ''NO Need Proceed'' යනුවෙන් සටහනක් යෙදීමෙන් තවදුරටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම් අවශ්‍ය නොවන බව සඳහන් කොට ඇත. මේ බව බේරුම්කරන අධිකරණය ද තහවුරු වී ඇත. (පිටු අංක 132) පරිදි

2023.11.30 දින බේරුම්කරනයේ දී අතිරේක අධ්‍යක්ෂක (පාලන) එස්. සී. පී. සූරියප්පෙරුම මිය සාක්ෂි දෙමින්

ප්‍ර සම්මුඛ පරීක්ෂණයෙන් පස්සේ ද අධ්‍යක්ෂක ජනරාල් කියලා තියෙනවා මේක කරන්න එපා කියලා

පි ඔව්

ප්‍ර 2021.10.25 කියනවා හැබැයි ඒකට හේතුවක් සඳහන් කරලා නෑ

පි හේතු සඳහන් කරලා නෑ

මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය 2021.10.25 අධ්‍යක්ෂක ජනරාල්ගේ සටහනක් තුළින් අත්හිටුවීම තුළ එම අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව ඉල්ලුම්කාරියට නොදන්වීමෙන් ඉල්ලුම්කාරියට නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන තනතුර ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරමි.

ඒ නිසා ඇයට 2019.08.31 වන දින සිට 2021.10.21 දක්වා මාස 25 දින 20 ක් ඇය එම තනතුරේ සේවයේ යෙදී සිටියා සේ සලකා

ඇයට එම තනතුරට හිමි ප්‍රතිලාභ සියල්ලම ඇයට හිමි විය යුතු බවට මම තීරණය කරමි.
ඉල්ලුම්කාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ලබාදුන් වැටුප් වර්ධක 04 ඇයට හිමිද යන්නයි.

2009.08.19 සිට ආයතනය ප්‍රතිව්‍යුහ ගත කිරීමට අනුව 1534/2014 මණ්ඩල පත්‍රිකාව මගින් වැටුප් විෂමතා ඉවත් කිරීමට අනෙකුත් සේවකයන් ට ලබාදුන් වැටුප් වර්ධක 04 ක් ඇයට ලබා නොදීම පිළිබද පහත කරුණු නිරීක්ෂණය විය.

එනම් 2009.08.19 දිනට නිලධාරියෙකු උපයා ගෙන තිබූ වැටුප පදනම් කරගෙන මෙම වැටුප් වර්ධක 04 ලබා දුන් බවයි. ඉල්ලුම්කාරිය එදිනට උපයාගෙන තිබු වැටුප MM1-03 (Grade II) අනුව රුපියල් 26970.00 ක් වූ මූලික වැටුප් පියවරට වඩා වැඩි අගයක් බවත් මේ අවස්ථාව වන විට ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වගන්තියට අනුව රුපියල් 30195.00 ක් වූ වැටුප් පියවරයට අන්තර්ග්‍රහනය කොට වැටුප් පියවරේ පිහිටුවා (Grade IV) 2009.08.19 වන දිනට (Grade III) 2010.04.20 වන දිනටත් ලබාදී 2012.04.20 දක්වා වැටුප් පියවරයන් පෙන්වා තිබෙන බවයි. (පිටු අංක 089) තවද 2024.01.17 කාර්මික අධිකරණයේ දී අතිරේක අධ්‍යක්ෂක මානව සම්පත් එම්. එන්. සූර්යකුමාරන් මහතා මූලික සාක්ෂි ලබාදෙමින්

ප්‍ර ඉල්ලුම්කාරියට ලබාදී තිබෙන වැටුප වඩා වැඩි ප්‍රමාණයක්, අඩු ප්‍රමාණයක් ද

පි වැඩි ප්‍රමාණයක්

(පිටු අංක 167)
මෙය විගණන වාර්තා වලින් ද තහවුරු වී ඇති බව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද R 20 (ඒ) මගින් පෙනී යයි.

ඉල්ලුම්කාරිය විසින් ඇයගේ ලිඛිත දේශනයෙන් වැටුප් වර්ධක 04 නොලැබීම නිසා සිදු වී ඇති මුල්‍යමයම පාඩුව වශයෙන් රු. 921487.37 ක් මුදලක් හා ඊට අදල පොලියක් ඉල්ලා සිටියත් එය ඇයට අදල නොවන බවට නිගමනය කරමි.

එබැවින් මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී වැටුප් විෂමතා නැති කිරීමට ලබාදුන් වැටුප් වර්ධක 04 ඇයට හිමි නොවන බවට නිගමනය කරමි.

ඉල්ලුම්කාරියට 2019.08.31 වන දින සිට 01 ශ්‍රේණිය හිමිද ඉල්ලුම්කරිය 01 ශ්‍රේණිය ඉල්ලා සිටින්නේ අභ්‍යන්තර වශයෙන් අවුරුදු 02 සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු වන අතර මෙම ශ්‍රේණිය රු. 88480.00 මූලික වැටුපෙන් ආරම්භ වූ අතර එය ඇයට ලබා දුනහොත් ජ්‍යෙෂ්ඨ මානව සම්පත් පරිපාලන අධ්‍යක්ෂක තනතුරේ වැටුපද ඉක්මවා යන බවයි. මේ අනුව එය තනතුරකට අදාල නොවන වැටුප් වැඩිවීමක් බව දෙවන පාර්ශ්වය විසින් සඳහන් කර ඇත. කෙසේ නමුත් 01 ශ්‍රේණිය හිමිකම් නොලැබුවද එහි ප්‍රතිලාභ ඇය ලබා ඇති බව පිටු අංක 274 සඳහන් කර ඇත.

2019.08.31 ඉල්ලුම්කාරියට 01 ශ්‍රේණිය හිමිද හිමි නම් ලබානොදීම පිළිබඳව නිරීක්ෂණය වන්නේ 2023.11.21 දෙවන පාර්ශ්වයේ පිළිතුරු ප්‍රකාශය අනුව පිටු අංක 275 - 276 අනුව ජ්‍යෙෂ්ඨ මානව සම්පත් පරිපාලන තනතුර අනුව පිහිට විය යුතු නිවැරදි වැටුප් තලය මධ්‍යම කළමනාකරණ මට්ටමේ MM1-03 01 ශ්‍රේණිය රු. 71585.00 ක වැටුප බවත්, කෙසේ වුවත් එවකට අධිකාරියේ පැවැති ක්‍රමවේදය අනුව ඉල්ලුම්කාරිය ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටම්වල සුදුසුකම් ලැබූ අනෙකුත් නිලධාරින් ඉහල කළමණාකාරිත්වයේ HM 1-1 (B) ලෙසින් 02 01 ශ්‍රේණිය ලබාදී රු. 81670 ක මූලික වැටුප පිහිටුවා ඇති බවත් අනතුරුව 2-1 ශ්‍රේණියේ වසර 2 ගතවන නිලධාරින් හට පසුව 1 ශ්‍රේණියේ HM 1-1 (B) ලෙසින් රු. 88480.00 ක මූලික වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීමක් කර ඇති බවත් ය.

ඉල්ලුම්කාරිය විශ්‍රාම ලැබූ 2021.10.21 වන දින සලකා බලන විට එම වර්ෂයේ සැප්තැම්බර් මාසය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නිකුත් කර තිබූ අංක 3228 දරන මල්ලිකා පී. උක්වත්තගේ මහත්මියගේ වැටුප් කුවිතාන්සිය අනුව ඇයගේ මූලික වැටුප රු. 88480.00 ක් වශයෙන් ගෙවීම් කර ඇති අතර සියළු දීමනා සහිතව අඩු කිරීම් නොමැතිව ඇයට රු. 1079187.00ක මුදලක් හිමි බවටද අදාළ කුවිතාන්සියේ සටහන් කර ඇත. එය ද සැලකිල්ලට ගනිමින් ඇයට අර්ථසාධක අරමුදල් සේවක අර්ථසාධක අරමුදල් පාරිතෝෂිත දීමනා තනතුරට අදාළ යැපීම් දීමනා වැටුප් වර්ධක සලකා බලා ඒ සම්බන්ධයෙන් නැවත ගණනය කිරීමක් සිදු නොවන බව ද ඊට අමතරව කිසිදු ව්‍යවස්ථාපිත දීමනාවකට හිමිකමක් නොමැති බව ද සැළකිල්ලට ගෙන මාස 25 දින 20 සේවය කලායැයි සලකා ඇයට සිදුව ඇති ආසාධාරණය නිවැරදි කීරීම සඳහා ඇයට එම කාල සීමාව (2019.08.31 සිට 2021.10.21 දක්වා) සඳහා වන්දියක් ගෙවීම සුදුසු බවට මම තීරණය කරමි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් විසින් ඉල්ලුම්කාරියට තුන්ලක්ෂයක වන්දියක් ගෙවිය යුතු බවට නියම කරමි.

මේ අනුව පහත සඳහන් පරිදි මල්ලිකා පී. උක්වත්තගේ මහත්මියට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

01 නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තනතුර 2019.08.31 වන දින සිට ඇයට හිමිවුවත්
ඇය විශ්‍රාම ගිය 2021.10.21 දක්වා එම තනතුර ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක්
වූ බව නිශ්වය වූ බැවින් අදාළ කාල සීමාව සඳහා ඇයට ගෙවිය යුතු වන්දි මුදල රු. 300000.00

එකතුව රු. 300000.00
රු. තුන්ලක්ෂයකි

ප්‍රදානය

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයන් වශයෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වී ඇති බවට ඉහත දක්වූ හේතුන් අනුව නිගමනය කරමි. ඒ අනුව රුපියල් තුන්ලක්ෂයක වන්දියක් ඉල්ලුම්කාරියට ගෙවිය යුතු බවට නියම කරමි. (රු. 300000.00) එය මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාසයක් ඇතුළත කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ වෙත තැන්පත් කල යුතු බවට ද නියම කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු.

2024 පෙබරවාරි මස 27 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණයේ දීය.

EOG 04 - 0014

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.